# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1713/34 — 2011 ජූලි 07 වැනි බ්‍රහස්පතින්දා - 2011.07.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65 අ (1) වැනි වගන්තිය යටතේ පෝරතිවුපත්තු ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතු කොටගෙන පෝරතිවුපත්තු ප්‍රාදේශීය සභාවේ සභාපති ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 65අ(1) වැනි වගන්තිය යටතේ, සභාපති වන රෙට්නසිංගම් මහේන්ද්‍රන් නම් වූ සභාපති අයත් වන්නා වූ තමිල් මක්කල් විඩුදලෛල්පුළිකල් නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට, දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභාපති වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් වන්නාවූ ද, ඒ පෝරතිවුපත්තු ප්‍රාදේශීය සභාවේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා විනායගමූර්ති සිරිදරන් මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

පෝරතිවුපත්තු ප්‍රාදේශීය සභාවේ තේරීම් භාර නිලධාරී රත්නායක රාලලාගේ අසංක සතිස් කුමාර රත්නායක වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, විනායගමූර්ති සිරිදරන් මහතා පෝරතිවුපත්තු ප්‍රාදේශීය සභාවේ සභාපති වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

අසංක රත්නායක,
තේරීම්භාර නිලධාරී,
පෝරතිවුපත්තු ප්‍රාදේශීය සභාව.

2011 ජූනි මස 28 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
මඩකලපුව.

07-579/1

1A - G 14773— 360 (2011/07)

**(262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65 අ (1) වැනි වගන්තිය යටතේ පෝරතිවුපත්තු ප්‍රාදේශීය සභාවේ උප සභාපති ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

උප සභාපති, සභාපති ධූරයට පත්වීම හේතු කොටගෙන පෝරතිවුපත්තු ප්‍රාදේශීය සභාවේ උප සභාපති ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 65අ(1) වැනි වගන්තිය යටතේ, උප සභාපති වන විනායගමූර්ති සිරිදරන් නම් වූ උප සභාපති අයත් වන්නා වූ තමිල් මක්කල් විඩුදලෛල්පුලිකල් නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට, දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත උප සභාපති වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් වන්නාවූ ද, ඒ පෝරතිවුපත්තු ප්‍රාදේශීය සභාවේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා සීරාලසිංගම් යෝගේස්වරන් මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

පෝරතිවුපත්තු ප්‍රාදේශීය සභාවේ තේරීම් භාර නිලධාරි රත්නායක රාලලාගේ අසංක සතිස් කුමාර රත්නායක වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, සීරාලසිංගම් යෝගේස්වරන් මහතා පෝරතිවුපත්තු ප්‍රාදේශීය සභාවේ උප සභාපති වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

අසංක රත්නායක,
තේරීම්භාර නිලධාරි,
පෝරතිවුපත්තු ප්‍රාදේශීය සභාව.

2011 ජුනි මස 27 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
මඩකලපුව.

07-579/2

---

**(262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65 අ (2) වැනි වගන්තිය යටතේ පෝරතිවුපත්තු ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතු කොටගෙන පෝරතිවුපත්තු ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

රෙටිනසිංගම් මහේන්ද්‍රන් නම් වූ සභිකයා අයත් වන තමිල් මක්කල් විඩුදලෛල්පුලිකල් නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30)ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් ඒ පෝරතිවුපත්තු ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන ගුණරෙටිනම් යෝගනාදන් මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

පෝරතිවුපත්තු ප්‍රාදේශීය සභාවේ තේරීම් භාර නිලධාරි රත්නායක රාලලාගේ අසංක සතිස් කුමාර රත්නායක වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, ගුණරෙටිනම් යෝගනාදන් මහතා පෝරතිවුපත්තු ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

අසංක රත්නායක,
තේරීම්භාර නිලධාරි,
පෝරතිවුපත්තු ප්‍රාදේශීය සභාව.

2011 ජුනි මස 27 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
මඩකලපුව.

07-579/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.